**මූතූර් ප්‍රාදේශීය සභාව**

**---------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-----------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 14දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 08 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 14 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මූතූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමලෝචිත වර්ෂයේ සභාවේ ලිපිද්‍රව්‍ය සහ විදුලිය තොග ලේඛනය පරිදි තොගය පිළිවෙලින් රු. 181,020ක් සහ රු. 49,845ක්ව පැවැති නමුත්, මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් රු.487,829ක් සහ රු.67,685ක් ලෙස දක්වා තිබුණි. | ලේඛන අනුව සභාවේ තොග මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට කටයුතු කළ යුතුවේ. | මෙම දෝෂය 2020 වර්ෂ ගිණුම්වල නිවැරදි කෙරේ. |
| (iii) | වරිපනම් හිඟ බදු මූල්‍ය ප්‍රකාශන අනුව රු.6,234,228ක් වූ අතර, හිඟ ආදායම් ප්‍රකාශයේ රු.6,307,745ක් ලෙස රු.73,519ක වෙනසක් පැවතුණි. | නිවැරදි හිඟ වරිපනම් බදු ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ වාර්තා සකස් කිරීමට ප්‍රථම නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයට පෙර රු.11,129,351 ක් වූ අත්තිකාරම් | අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ | ඉදිරි අනාගතයේදී මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

ශේෂ සම්බන්ධයෙන් අත්තිකාරම් යුතුවේ.
ලේඛනය විගණනයට ඉදිරිපත්
කර නොතිබුණි.

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතියේ X පරිශිෂ්ඨය | | | |
| | (i) 191 වගන්තිය | පිටපත් විගණනයට ඉදිරිපත් කළ යුතු බව සඳහන් ව තිබුණත් සමාලෝචිත වර්ෂයේ කම්ටු වාර්තා 12හි මාසිකව සහා කම්ටු වාර්තාවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මාසිකව සභා කම්ටු වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුවේ. | මාසිකව පැවති සභා රැස්වීම් පවත්වා දින 15කින් ඔබ වෙතඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| | (ii) 193 වගන්තිය | වර්ෂයට අදාළ තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර අයවැය සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | වර්ෂයේ තථ්‍ය ආදායම සහ වියදම පිළිබඳ විස්තර අයවැය සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 30ක් ඇතුළත ඔබ වෙත යැවීමට කටයුතු කරනුලැබේ. |
| (ආ) | මෝටර් රථ ප්‍රවාහන පනත 203 වගන්තිය | වාහන 13 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ධාවනයේ යොදවාගනු ලබන (Running Condition) තත්ත්වයේ පවතින සියළුම වාහන සඳහා ආදායම් ලබපත්‍ර ලබාගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාවේ භාවිතයේ පවතින වාහන 21ක් සඳහා සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | වාර්තාව ලබාගැනිමට සුදුසු පියවර ගත යුතුවේ. | ධාවන තත්ත්වයේ පවතින සියළුම වාහන ඉන්ධන පරීක්ෂාකරු විසින් පරීක්ෂා කර ඇත. එනමුත් ඔවුන්ගෙන් වාර්තාව මේ දක්වා ලැබී නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 24,896,945ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,170,412ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම්හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 1,217 | 1,217 | 929 | 6,234 | 850 | 850 | 422 | 6,213 |
| කඩ කුලී | 20,590 | 13,997 | 14,327 | 6,262 | 17,295 | 14,512 | 14,014 | 3,281 |
| බලපත්‍ර ගාස්තු | 1,901 | 1,438 | 1,156 | 744 | 1,398 | 1,369 | 1,180 | 218 |
| එකතුව | 23,708 | 16,652 | 16,412 | 13,240 | 19,543 | 16,713 | 15,616 | 9,712 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවතින ඉඩම් සහ ඉදිකළ නිවාස, ගොඩනැගිලි ආදිය මත සමාලෝචිත වර්ෂය අවසාන වන විටඅයකර ගත යුතුවරිපනම් හා බදු එකතුව රු.6,234,228 ක් අයකර ගෙන නොතිබුණි. | අදාල විෂයන් කෙරෙහි වැඩි අවධානය යොමු කර හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | දැනට පසුගිය වර්ෂ වෙනුවෙන් වූ හිඟ වරිපනම් බදු අපගේ සභාවේ සේවකයන් මාර්ගයෙන් අයකෙරෙමින් පවති. |

## 2.2.3 බස් නැවතුම්පොළ කඩ කාමර කුලී ආදායම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ගිවිසුම් අත්සන් කර කඩ කාමර බදු දිය යුතු නමුත් කඩ කාමර 40 න් කඩ කාමර 33 ක් පමණක් ගිවිසුම් ගත වී බදු කාලය සඳහන් නොකර දීර්ඝකාලීන බද්දට ලබා දී තිබුණි. | ගිවිසුම් අත්සන් නොකළ කඩ කාමර සඳහා ගිවිසුම්අත්සන් කිරීමට කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් අත්සන් කර නොමැති කඩ කාමර 06ක් සඳහා ගිවිසුම් අත්සන් කිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ii) | කඩ කාමර සම්බන්ධයෙන් 2014 ජනවාරි 01 දින සිට විගණන දිනය වන 2019 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගත යුතු රු.922,250 ක හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ කුලී කොටස් වශයෙන් අයකර ගනිමින් පවතින අතර ගෙවීම් නොකළ අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (iii) | ගිවිසුම් 2 වගන්තිය ප්‍රකාරව 2016 වර්ෂයේ සිට වර්ෂයක් පාසාම කුලී වටිනාකමින් 10% ක් වැඩි කළ යුතු බව සඳහන් වුවද, මේ දක්වා මෙම වැඩිකිරීම සිදුකර නොතිබුණි. | 10% ක වැඩිවීමක් සමගගිවිසුම් අතිසන් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි ගිවිසුම් අළුත් කර සියළු දෙනාටම ලබාදිමේදි වර්ෂයක් පාසාම වටිනාකමින් 10% ක් වැඩිකිරීම පෙන්වා ගිවිසුම් අත්සන් කර හිඟ කුලි සම්පූර්ණයෙන්ම අයකිරීම් සිදුකිරීමට කටයුතු යොදා ඇත. |

## 2.2.4 නාවලවඩි හන්දියේ කඩ කාමර පේළිය කුලියට ලබාදීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්යාල කඩ කාමරවලින් සහනාවලවඩි හන්දියේ කඩ කාමර පේළිය සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා හිඟ කුලී රු.815,808ක් සහ රු.9,900 ක් වුවද, මෙම හිඟ මුදල් විගණන දිනය වන 2020 පෙබරවාරි 24 දින වන විටත් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකිරීමේ කටයුතු සිදු කළ යුතුවේ. | නාවලවඩි හන්දියේ කඩ කාමර පේළිය සඳහා බදු ගිවිසුමේ කාලය 2019.11.30න් අවසන් වේ. මෙම කඩකාමර සඳහා ලංසු ඇප බදු ආදායමට මාරුකර නිරවුල් කරනු ලැබේ. එසේම, කාර්යාල සංකීර්ෂයේ යට පිහිටි කඩ කාමර පේළි සඳහා බදු කාලය 2022 වර්ෂයෙන් අවසන් වේ. එයට අදාල ලංසු තැන්පතුත් මෙහි අඩංගු වේ.එය ආරක්ෂිත ඇපයකට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.5** වෙළඳපොල කඩ කාමර ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් කඩ කාමර 82 ක් වර්ෂ 35 කට පෙර කුලියට ලබාදුන් අවස්ථාවේදි එළඹ තිබූ ගිවිසුම් ඉන්පසුව අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් අළුත්කිරීමට පියවර ගත යුතුවේ. | එළඹ තිබූ ගිවිසුම් අළුත්කර නොමැතිව පවතින නිසා ඒවා අළුත්කිරීමේ කටයුතු කඩිනමින් සිදුකෙරේ. |
| (ආ) | මෙම කඩ කාමර හිඟ කුලී සමාලෝචිත වර්ෂය දක්වා රු.1,509,427 ක් වුවද, මෙම හිඟ කුලී මුදල් විගණන දිනය වන 2020පෙබරවාරි 24 දින වන විටත් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකිරීමට කටයුතු කළ යුතුය. තවද, ඉදිරි කාලයේදී හිඟ කුලී ඇති නොවන අයුරින් කුලී අයකිරීම සිදුකළ යුතුවේ. | 2019.12.31 දින වන විට හිඟහිටි රු.310,935ක් අයකර ගෙන තිබුණි. මෙම මුදල සැසඳීම් කිරීමේදී අඩු අගයක් ලෙස පෙනුණත්, ඉතා ඉක්මනින් අදාළ කාල සීමාවන් ලබාදෙමින් සියළුම මුදල් අයකිරීමට කටයුතු කරනු ලැබේ. එසේම, නියමිත කාලසීමාව තුළ හිඟ මුදල් නොගෙවූ කඩකාමරවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඇ) | මෙම ප්‍රදේශයේ වර්තමානයේ පවතින කුලී වටිනාකම අවම වශයෙන් රු.3,000 සිට රු.5,000 ක් වුවද, සභාව විසින් වර්ෂ 35 කට පෙර තීරණය කළ රු.150 සිට රු.500 දක්වා පරාසයකින් මේ දක්වා කුලී වටිනාකම තීරණය කර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තු වාර්තා ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුවේ. | අපගේ කාර්යාලයේ සිටින ආදායම් සුපරීක්ෂකවරුන් ලවා කඩ කාමරවල තොරතුරු රැස්කර වර්ගඵලයට අනුව තාවකාලික කුලියක් තීරණය කර කුලී අයකිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | කඩ කාමර ලබාගත් කඩ කුලී හිමියන් 15 දෙනෙකු එම කඩ කාමර මාසික කුලිය රු.700 සිට රු.4,500 ක් වන වටිනාකමට උප බදු දී තිබුණි. | සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | සියළුම කඩ කාමර පරීක්ෂා කොට මේ සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**2.2.6** මස් කඩ බදු ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මස් කඩ බදුකරුවන් බදු ගෙවීම පැහැර හැරීමේදී ඔවුන්ගේ ආරක්ෂිත ඇප තැන්පතුවලින් බදු වටිනාකම අය නොකර වර්ෂය අවසානයේ මෙම ක්‍රියාවලිය අනුගමනය කරන බැවින් | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පසුගිය 2019 වර්ෂයේ ආරම්භක හිඟ හිටි ලෙස රු.8,297,399 ක් මස් කඩ හිඟ ආදායම් වශයෙන් පැවතුණද, සමාලෝචිත වර්ෂයේ දැනට හිඟහිටි ප්‍රමාණය රු.7,279,598 ක් පවති. එසේම 2019 වර්ෂ සඳහා බදු මුදල |

| | | |
|---|---|---|
| රු.7,279,598 ක් වූ හිඟ, අයකර නොමැතිව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි. තවද, මෙම හිඟ මුදල් සඳහා සභාව විසින් කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ශේෂ සනාථ කළ නොහැකි විය. | | සම්පූර්ණයෙන්ම අයකර තිබුණි. |

**2.2.7 මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමලෝචිත වර්ෂය අවසාන වන විට ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ මුද්දර ගාස්තු විස්තර ජනවාරි සිට අප්‍රේල් දක්වා ලැබී තිබේ. අනෙකුත් මාසවල විස්තර රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් ලබාගැනීමේ පියවර ගෙන ඇත. සියළු විස්තර ලැබූ වහාම උචිත පරිදි අයකරගනු ලැබේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **අතුරු ව්‍යවස්ථා** | | |
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ වියදම් කිරීම් සඳහා ප්‍රධාන කාරණා 20ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුවේ. | පළාත් සභා විසුරුවා හැර ඇති නිසා මේ දක්වා ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. |

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිනියගේඅදහස් දැක්වීම |
|---|---|---|
| සාම්පූර් ප්රදේශයේ පුරනැඟුම ව්‍යාපෘතියේ මූලා ප්‍රතිපාදන යටතේ 2017 වර්ෂයේදී රු.4,094,702 ක වියදමින් ඉදිකළ මාතෘ ළදරු රැකබලා ගැනීමේ මධ්‍යස්ථානය අදාළ අවශ්‍යතාවය සඳහා භාවිතා නොකර ප්‍රජා මූල මධ්‍යස්ථානයට ලබා දී තිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීමේදි උචිත කාර්යසාධන වාර්තා සකස් කර ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු කළ යුතුවේ. | කඩිනමින් එම ගොඩනැගිල්ල සභාවේ කටයුතු වෙනුවෙන් ආදායම් ඉපැයිය හැකි දේපළක් ලෙසට මාරු කරනු ලැබේ. |

**(ඇ) අත්හැර දැමූ ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිනියගේඅදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් 03ක් ආරම්භ කිරීමට රු.9,100,789ක් වැය කර තිබුණත්, විගණන දිනය වන 2020.02.28 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර නොගෙන එම කොන්ත්‍රාත් අත්හැර දමා තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාර අදාල ඉදිකිරීම් වැඩ ඉටුකරවා ගත යුතු අතර ඒ අනුව ගෙවීම් සිදුකල යුතුවේ. | ආසාද් නගර් සහ තෝප්පූර් විවේකි උද්‍යාන වෙනුවෙන් ගිවිසුම් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ අත්සන් කිරීමෙන් පසුව අප කාර්යාලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මෙම කාර්යය සඳහා අරමුදල් අදාල කොන්ත්‍රාත්කරුට ලබානොදිම හේතුවෙන් ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරගෙන යා නොහැකිව අතරමැද නවතා තිබුණි. ජින්නා ප්‍රජා මධ්‍යස්ථානය ඉදි කිරිමේ ව්‍යාපෘතිය ප්‍රජාමුල මධ්‍යස්ථානය මාර්ගයෙන් ගිවිසුම් අත්සන් කරනු ලදි. මෙය උප කොන්ත්‍රාත්කරුට ලබාදිම සහ මෙහි ගෙවීම් උප කොන්ත්‍රාත්කරුට ලබානොදිම නිසා මූල්‍ය අර්බුදය හේතුවෙන් ඔහු විසින් ව්‍යාපෘතිය අතරමැද නවතා දමා තිබුණි. |
| (ii) | වල්ලික්කේනි ප්‍රධාන මාර්ගය ඉදිකිරීම රු.1,926,960 ක වටිනාකමකට ප්‍රජා මූල සංවිධානයකට භාරදී තිබූ නමුත් | සුදුසුකම් ලත් නිර්ව්‍යාජ කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් පිරිනැමීමට කටයුතු කර ඔවුන් ලවා අදාල කර්යය ඉටු කරවා ගත යුතුවේ. | මාර්ගයේ ඉතිරි වැඩ කඩිනමින් සිදුකර නිම කරනු ලැබේ. |

කොන්ත්‍රාත්තුව අතරමග නවතා දමා තිබුණි.

**(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිනියගේඅදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරනතිරසාර සංවර්ධන ඉලක්ක පනතේ ප්‍රකාරව එහි අරමුණු සහ ඉලක්ක ආදිය සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. තවද, 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සකස් කර නොතිබුණි. | ආයතනයට සරිලන තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙනඑයට අනුව නියමු වැඩසටහන් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේ තිරසාර සංවර්ධනය පිළිබඳ ඉලක්ක හඳුනාගෙන එයට අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | එක් අක්‍රීය බැංකු ජංගම ගිණුමක රු.55,351 ක් ශේෂය වර්ෂ 12 ක සිට පැවතුණද එම ගිණුම ආදායම් ඉපැයිය හැකි ආකාරයකට මාරු කිරීමට විගණන දිනය වන 2020 පෙබරවාරි28 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සුදුසු පියවර ගතයුතුවේ. | මේ සඳහා අඛණ්ඩව ක්‍රියා කරනු ලැබේ. |
| (ආ) | යුනිසෙෆ් ආයතනය මූල්‍ය ප්‍රධාන යටතේ සාම්පූර් ප්‍රදේශයේ යළි පදිංචි වූ ප්‍රතිලාභීන් තිදෙනෙකුට ජල සම්බන්ධතා පහසුකම් ලබාදීමට රු.11,344 ක් 2016 දෙසැම්බර් 25 දින ගෙවා තිබුණු නමුත් මේ දක්වා ජල සම්බන්ධතාවයන් ලබාදී නොතිබුණි. | ජල සම්බන්ධතාවය ලබාදීමට කටයුතු කළ යුතුවේ. | ජල සම්බන්ධතාව ලබාදීම සඳහා කරනු ලැබූ ගෙවීම් ආපසු ලබාගැනීමට කටයුතු කරමින් පවතී. එසේම ජල සම්බන්ධතාවය ලබාදීමේදී මෙම ගෙවීම් ආපසු ලබාදීම සඳහා කටයුතු කෙරේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **සේවක ණය** | | |
| අනියම් සේවකයෙකුට ලබාදුන් රු. 102,620ක ණය වර්ෂ 10 සිට අයකර නොමැතිව හිඟහිටිව පැවතුණි. | සුදුසු පියවර ගතයුතුවේ. | ණය අයකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා කපා හැරිමට කටයුතු කරනු ලැබේ. එසේම, ඒ පිළිබඳව සභාවේ අනුමැතියද ලබාගෙන ඇත. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 අයිතිය පවරා නොතිබූ වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ මෝටර් රථ 12 ක් වර්ෂ 13 කට අධික කාලයක සිට සභාව විසින් භාවිතා කරමින් තිබූ නමුත් ඒවා සභාවේ නමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන අයිතිය සභාවේ නමට පැවරීමට කටයුතු කළ යුතුවේ. | මාගේ අංක MUPS/WP/RMP/2017 දරන 2017.10.25 දිනැති ලිපිය මගින් වාහන අයිතිකරුවන්ගේ විස්තර ලබාගැනීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ලිපි යවා ඇත. ලිපිලේඛන ලබාගැනීමෙන් පසුව පමණක් මේවා වෙන්දේසි කළ හැකිවේ.එනමුත් මේ සඳහා විසඳුම් කඩිනමින් ලබාගැනීමට නියමිතය. |

#### 3.4.2 වත්කම්වලින් ලබාගත යුතු අදායම් ලබාගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තෝපූර්වල පිහිටි සභාවට අයත් ගොඩනැගිල්ලේ ඇති කාමරයක් 2006 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලයේ උප-කාර්යාලයක් ක්‍රියාත්මක කිරීමට ලබාදී තිබූ නමුත්, මේ දක්වා කිසිදු ගිවිසුමක් අත්සන් කර කුලී අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කර කුලි අයකිරිමට කටයුතු කළ යුතුවේ. | තෝපූර්වල විදුලි බල මණ්ඩලයට ලබාදී ඇති ගොඩනැගිල්ල පිළිබඳව අදාල ලිපිගොනුව පරික්ෂා කර වහාම කටයුතු කරනු ලැබේ. එසේම ඒ පිළිබඳ ඒ ඒ අවස්ථාවේදී ඔබ වෙත දැනුම් දීමට කටයුතු කරනු ලැබේ. |

3.4.3 නිෂ්කාර්යව පවතින වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව **pickup** වාහන අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයේ පැවැතුණද, වර්ෂ දෙකකට අධික කාලයක සිට අලුත් වැඩියා කිරීමට හෝ ඒවා වෙන්දේසියේ විකිණීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවැතුණි. | වාර්තා ලබාගෙන ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වේ. | **Pickup**වාහනය ප්‍රසිද්ධ වෙන්දේසියට ඉදිරිපත් කිරීම සඳහා මිල තක්සේරු කමිටුව විසින් අධීක්ෂණය කර මිල තීරණය කර තිබුණි. එනමුත්, එහි වාර්තාව මේ දක්වා ලැබී නොතිබුණි. ලැබූ වහාම ඒ පිළිබඳව කටයුතු කරනු ලැබේ. |

3.4.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කළ කමිටුව සභාවේ පැවැති ට්‍රැක්ටර් 04ක් ජල බවුසර් 03ක්, අපද්‍රව්‍ය ඉවත් කරන බවුසරය සහ යතුරු පැදි ආදිය විකුණන ලෙස නියෝග කර තිබුණත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාර්තා ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුවේ. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් හඳුනාගත් ට්‍රැක්ටර් 04, ජල බවුසර් 03ක් මෝටර් රථ පරීක්ෂකවරුන් විසින් අවම මිල තීරණය කිරීම සඳහා පරීක්ෂා කර ඇත. එනමුත්, ඒසඳහා මිල තීරණ වාර්තාව ලැබී නොතිබුණි. ලැබූ වහාම ඒ පිළිබඳ ඉදිරි කටයුතු කරනු ලැබේ. |

3.5 ප්‍රසම්පාදනය

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සභාව විසින් සකස් කර නොතිබුණි. | සෑම වර්ෂයක් වෙනුවෙන්ම ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට එය විධිමත්ව සකස් කර අදාල අය වෙත යවා ඇත. |

3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------
(අ) කසල ටැංකි ඉදිකිරීම
--------------------------

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | --------------------------- | ------------------ | ------------------------ |
| (i) | මෙම කාර්යය සඳහා අත්සන් කළ ගිවිසුමෙහි, ගිවිසුම් අත්සන් කළ දිනය, ගිවිසුම් කාල පරාසය ආදිය සඳහන් නොවී පැවැතුණි. මේ හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකළ නොහැකිවී තිබුණි. | ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් කාලය වැරදිමකින් සඳහන්ව නොතිබුණි. ඉදිරි කාලයේදී අවධානයට ගනු ලැබේ. |
| (ii) | විගණන දිනය වන 2020 පෙබරවාරි 28 දින දක්වා රු. 355,774ක් වටිනා තීන්ත ආලේපන, වැලි අතුරා පිරිසිදු කිරීම ආදි කාර්යයන් අවසන් වී නොතිබුණි. | වැඩ කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදි මෙවැනි අඩුපාඩු සිදු නොවන ආකාරයට කටයුතු කරනු ලැබේ. |
| (iii) | මෙම කාර්යය සැලැසුම් කළ පරිදි නියමිත කාල පරාසය තුළ අවසන් නොකළ නිසා මේ දක්වා වැය කළ රු.826,174කින් ලැබිය යුතු ප්‍රතිඵල ලබාගැනිමට කල් ගතවී තිබුණි. | ව්‍යාපෘතිය නිමකර එහි ප්‍රතිඵල ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදි අදාල වටිනාකමට සරිලන කාර්යයන් සිදු කිරීමට කටයුතුකරනු ලැබේ. |

(ආ) කොන්ක්‍රිට් මංමාවත් ඉදිකිරීම්
--------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------------- | ------------------ | ------------------------ |
| සභාව විසින් 2019 වර්ෂයේ කොන්ක්‍රිට් මාර්ග 04ක් ඉදිකර තිබුණත්, මාර්ගවලට අතුරා තිබු බොරළුවල දිග පළල උස ප්‍රමාණ බිල් පත්‍රයේ සඳහන් නොකර බොරළු අතුරා තිබීම නිසා සත්‍ය වශයෙන් අතුරා තිබු බොරළු ප්‍රමාණය ගණනය කළ නොහැකිව තිබුණි. | බොරළු ඇතිරීමේදි දිග පළල උස ආදිය ප්‍රමාණ බිල පත්‍රයේ සඳහන් කළ යුතුවේ. | මේ දක්වා කාලයක් අප සභාව විසින් හෝ නැතහොත් NELSIP වැනි ව්‍යාපෘතිවලින් හෝ ක්‍රියාත්මක කළ මාර්ගවලට දැමු බොරළු ප්‍රමාණ බිල් පත්‍රයේ Pilling measurement මගින් ගෙවීම් නිර්දේශ කළ බැවින් එම ක්‍රමවේදයම අඛණ්ඩවම සිදුකෙරෙමින් තිබුණි. |

(ඇ) ඉඩම්වල අයිතිය තහවුරු නොකිරිම

-----------------------------------------------

පහත සඳහන් ඉදිකිරීම් සිදු කිරිමේදි ඉඩමේ අයිතිය තහවුරු නොකර ඉදිකිරිමට කටයුතු කර තිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------------- | -------------------- | ---------------------------- |
| (i) | තෝප්පූර් විවේකි උද්‍යානය | ඉඩමේ අයිතිය තහවුරු කළ පසු ගොඩනැගිලි ඉදිකළ යුතුවේ. | ඉදිරියේදි මේ පිළිබඳව අවධානය යොමුකරනු ලැබේ. |
| (ii) | ජින්නා ප්‍රජා මුල මධ්‍යස්ථානය ඉදිකිරීම | ඉඩමේ අයිතිය තහවුරු කළ පසු ගොඩනැගිලි ඉදිකළ යුතුවේ. | ඉදිරියේදි මේ පිළිබඳව අවධානය යොමුකරනු ලැබේ. |